# 03.බහු සංස්කෘතික ජන සමාජය.

## සංස්කෘතිය .



- සංස්කෘතිය යනු යම්කිසි ස්ථානයක යම්කිසි සාමූහික පිරිසක් ජීවත් වන ජීවන ක්‍රමය වේ .
- ඔවුන්ගේ ආහාර , ඇඳුම , විශ්වාස , කලාශිල්ප , සිරිත්විරිත් , ගති පැවතුම් , ආගම් , භාෂා සංස්කෘතික අංග වේ .
- ඊ .බී . ටයිලර් මහතා හා මහාචාර්ය විමල් දිසානායක මහතා සංස්කෘතියේ අරුත විවිධ අයුරින් පෙන්වාදී ඇත .

## බහු සංස්කෘතිය .

- එකම රටක් තුල විවිධ ජන වර්ග ජීවත් වන , විවිධ ආගම් අදහන , විවිධ භාෂා කතාකරන , විවිධ සිරිත්විරිත් අනුගමනය කරන මිනිසුන්ගෙන් සමන්විත සමාජයක් **බහු සංස්කෘතික සමාජයකි .**

## බහු සංස්කෘතික සමාජ පවතින රටවල් .

- ශ්‍රී ලංකාව .
- ඉන්දියාව.
- ඇමරිකා එක්සත් ජනපදය.
- බ්‍රිතාන්‍ය .

## බහු සංස්කෘතික සමාජ ක්‍රමයක් තුල ප්‍රගුණ කල යුතු ගුණාංග .

- සෑම ජන වර්ගයකටම ගරුකිරීම .
- සෑම ජන වර්ගයකටම පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිම.
- කිසිදු ජන වර්ගයක් , ආගමික කණ්ඩායමක් උසස් හෝ පහත් කොට නොසැලකීම .
- සෑම ආගමක ම හා ජනවර්ගයකම සංස්කෘතික උරුම ආරක්ෂා කිරීම හා ඒවාට ගරු කිරීම .
- අන් අයගේ මත වාද , අදහස් ඉදිරිපත් කිරීමට ඇති අයිතිය පිළිගැනීම හා ඒවාට ඇහුම්කන්දීම .
- තම යුතුකම් නොපිරිහෙලා ඉටුකිරීම .


## බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ .


1) විවිධ ජනවර්ග ජීවත්වීම .
2) විවිධ ආගම් අදහනු ලබන ජන කොටස් ජිවත් වීම .
3) විවිධ භාෂා කතා කරන ජන කොටස් ජිවත් වීම .
4) විවිධ සිරිත්විරිත් දක්නට ලැබීම .
5) විවිධ සංස්කෘතික උරුම පැවතීම .





විවිධ ආගම් අදහන පිරිස හා විවිධ ජන වර්ගයා ශ්‍රී ලංකාවේ ද ජීවත් වේ .







ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගමික සිද්ධස්ථාන . මේවායේ රූප ඔබට සොයා ගත හැකි පරිදි සොයා අලවන්න . ඒවා බහු සංස්කෘතික සමාජයක ලක්ෂණ ඔබේ වචනයෙන් විස්තර කර එම ලක්ෂණ යටතේ අලවන්න .

බෞද්ධයෝ තම ජීවිත බුදුරජාණන්වහන්සේගේ බෞද්ධ ඉගැන්වීම යටතේ ගොඩනගා ගැනීමට බොහෝසේ වෙරදරයි . ධර්මානුකූල බව මගින් ජීවිතයේ අරුතත්, යලි යලිත් ඉපදෙන මැරෙන සසර ගැනත් , ස්භාවධර්මේ හා බැඳුණු පින් පව් ගැනත් මනාව උන්වහන්සේ බුද්ධ ධර්මයේ පෙන්නාදෙයි . ආමිස හා ප්‍රතිපත්ති පූජාවලින් පොහොය දොළහේම දාන , ශිල , භාවනා ආදී පින්කම් රැසක් ඔවුන් සිදුකරයි . ඉන් වෙසක් , පොසොන් , ඇසළ පොහොයවල් ඔවුන්ගේ ප්‍රධාන උත්සව වේ . බුදුරජාණන් වහන්සේගේ ඉපදීම , බුදුවීම , පිරිනිවීම වෙනුවෙන් වෙසක් පෝයද ලංකාවට බුදුදහම ලැබීම වෙනුවෙන් පොසොන් පෝයද බුද්ධත්වයෙන් පසු ප්‍රථම ධර්ම දේශනය පැවැත්වීම සිහිකර ඇසළ පොහොයද සමරති .

හින්දු ආගමිකයන් ශිව , විෂ්ණු , ස්කන්ධ , ගනේෂ , කාලි වැනි දෙවිවරුන් අදහන අතර ඔවුන් වෙනුවෙන් විවිධ වර්ගයේ පුද පූජා පවත්වනුලබයි . දිනපතා කටයුතු දෙවියන් වැද ආරම්භ කරන ඔවුන් උපතේ සිට මරණය දක්වා චාරිත්‍ර හින්දු සංස්කෘතිකව සිදුකරයි .

සැම කිතුනුවෙකුම තම දරුවා බෞතිස්ම කොට දෙවියන්ගේ දරුවෙකු කරමින් ඔවුන්ගේ විවාහ ගිවිස ගැනීම , විවාහ මංගල්‍ය මෙන්ම මරණින් පසු ඔහුගේ ආත්මය වෙනුවෙන් යාච්ඤා කිරීම , භූමදානය කිරීම ආදී ජීවිතයේ සුවිශේෂී අවස්ථා සියල්ල පල්ලිය ආශ්‍රිතව සිදුකනු ලබයි . සැම දිනකම දෙවියන් වෙනුවෙන් යාච්ඤා කරන අතර ජේසුස් වහන්සේගේ උපත සිහිකර සැම අවුරුද්දකම දෙසැම්බර් 25 නත්තල් සමරන අතර උන්වහන්සේ කුරුසයේ ඇණ ගැසිම වෙනුවෙන් මහා සිකුරාදා මෙන්ම එතුමාගේ උත්තානය සිහිකරමින් පාස්කු උත්සවය ද සමරනු ලබයි .

ඉස්ලාම් බැතිමතුන් මහම්මත් නබි තුමාගේ උපන්දිනය වෙනුවෙන් දුගීමගින්ට දන්දීම සිදුකරන අතර දින 30ක් උදේ සිට හවස් වනතෙක් උපවාසකිරීම මගින් ආරම්භකරන රාමසාන් උපවාසය අවසන්කරමින් උත්සවය සමරයි.ඉස්ලාම් බැතිමතුන්ගෙන් පිරිඉතිරි යන මක්කම ගමන ආරම්භවන්නේ හජ්ජි උත්සවයෙන් පසුයි .

# බහු සංස්කෘතීන් පවතින රටවල් .

❖ **ඉන්දියාව .**

| ජනවර්ගය | භාෂා | ආගම් |
|---|---|---|
| දෙමළ , උර්දු , බෙංගාලි , මුස්ලිම් , බන්ජාරා , චක්මා , මරාති , මුන්ඩා. | හින්දි , උර්දු , දෙමළ , ඉංග්‍රීසි, මරාටි, මලයාලම් ,පංජාබි , තෙලිගු , ගුජරාටි , කන්නඩා , සංස්කෘත . | හින්දි , කතෝලික , ඉස්ලාම් , බෞද්ධ , ශිව . |

## බහු සංස්කෘතික රටක් වශයෙන් ඉන්දියාව අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග .

- සෑම ආගමකම විවිධ භාෂා කතා කරන කණ්ඩායමක්ම සමානාත්මතාවෙන් යුතුව සැලකීම .
- රාජ්‍ය භාෂා ලෙස හින්දි හා ඉංග්‍රීසි භාෂා භාවිතා කිරීම .
- සෑම පුරවැසියෙකුම රාජ්‍ය භාෂාවට අමතරව වෙනත් භාෂාවක් දැන සිටිය යුතුයි.
- තම ආගම ඇදහීමේ නිදහස සහ අයිතිය ආරක්ෂා කිරීමට පියවර ගැනීම .

## ❖ ඇමෙරිකා එක්සත් ජනපදය .

**ජනවර්ග** - සුදු ජාතින් , කළු ජාතින් , ආසියානු ජාතින් , රතු ඉන්දියානුවන් , ඇලෙක්සානුවන් , හවායියන් , සහ පැසිපික් කලාපිය ජන කොටස්.

**භාෂා** - ඉංග්‍රීසි , ස්පාඤ්ඤ , සැමොන්, කැමරු , චීන , වියට්නාම් , කොරියන් , ජර්මන් , ප්‍රංශ , රුසියන් , ඉතාලි .

ආගම් - ප්‍රොතෙස්තන්ත්‍ර රෙපරමාදු , රෝමානු කතෝලික , වෙනත් ක්‍රිස්තියානි , මුස්ලිම් , බෞද්ධ , ජුදා

## බහු සංස්කෘතික රටක් වශයෙන් ඇමෙරිකාව අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග .

- ඉංග්‍රීසි භාෂාව රාජ්‍ය භාෂාව ලෙස පිළිගැනිම .
- කිසිදු ආගමක් රාජ්‍ය ආගම ලෙස නොපිළිගැනීම .
- සෑම පුරවැසියෙකුටම සමාන අයිතිවාසිකම් හිමිවීම .
- ප්‍රජාතන්ත්‍රවාදය පිළිගැනීම හා ඊට අනුකූලව ක්‍රියා කිරීම .